ඝාතන සිදුවීමක් හා බැඳි දිවි තොර කරගැනීමක් සෑමවිටම සාමාන්‍ය දිවි තොරකරගැනීමේ සිදුවීමකට වඩා ඉහළ අවධානයක් ලබාගැනෙනා බැවින්, එවැනි සිදුවීම් වාර්තාකරණයේදී වැඩිමනත් ප්‍රවේසම් වීමක් අවශ්‍ය බව පැවසේ. එහිදී යෝග්‍ය භාවිතාව විය යුත්තේ දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් තරයේ පිළිපැදීමයි.

ගල්ගමුව මහනාන්නේරිය ප්‍රදේශයේ සිදුවූ බවට වාර්තා වන ඝාතන-දිවි තොර කරගැනීම් සිදුවීම මුද්‍රිත මාධ්‍ය සහ රූපවාහිනී මාධ්‍ය මගින් වාර්තා කර ඇති ආකාරය මෙහිදී අපට සැලකිල්ලට ගත හැක. එහිදී උල්ලංඝනය වී ඇති දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන් සහ එම උල්ලංඝනයන්ගෙන් සිදුවිය හැකි බලපෑම් පහත පරිදි වේ.

1) යමෙකු දිවි තොර කරගත් ආකාරය පුවත් වාර්තාවක් හා ඉදිරිපත් කිරීම මගින්, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුට ඊට උත්ප්‍රේරණයක් ලබාදීමේ හැකියාවක් ඇති අතර, ඒ ඔස්සේ අනුකාරක දිවි තොර කරගැනීම්ද සිදුවීමේ ඉඩක් පවතී.

2) දිවි තොර කරගත් අයෙකුගේ ඡායාරූප පළ කිරීමේදී ඒ සඳහා පවුලේ අයගේ අවසරය අවශ්‍ය වන අතර, ඊට අමතරව එය අතිශයින්ම ප්‍රවේසම්කාරීව කළ යුතු දෙයක් වේ. මන්දයත්, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයෙකුට එවැනි ඡායාරූප ඔස්සේ දිවි තොර කරගැනීමට උත්ප්‍රේරකයක් සැපයීමටත් හැකියාවක් ඇති බැවිනි.

3) උක්ත හේතුව නිසාම දිවි තොර කරගත් අයෙකු ලියූ ලිපි ආදියද පළ නොකළ යුතු වේ.

4) එසේම, දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම අවශ්‍ය වේ. මන්දයත්, ඒ ඔස්සේ එම පුවත් වාර්තාව කියවන දිවි තොර කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයෙකුගේ ජීවිතය බේරාගැනීමට ඉඩක් ලැබිය හැකි බැවිනි.

මෙම දැක්වූ දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන් තරයේ පිළිපැදීම, විශේෂයෙන්ම සැලකිල්ලට ගත යුතු මාධ්‍ය වගකීමක්ද වනු ඇත.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Guidance_for_reporting... https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima #Dinamina #Aruna #Lankadeepa #SundaObserver #Sirasa #Swarnawahini #Hiru #Derana #Rupavahini**